# දැරණියගල ප්‍රාදේශීය සභාව

# කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 මැයි 31 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව දැරණියගල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සේවක ණය ලේඛණය අනුව 2012 දෙසැම්බර් 31 දිනට හිඟ සේවක ණය ශේෂය රු. 2,321,135 ක් වුවද, ශේෂ පත්‍රයේ එය රු. 1,446,624 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 874,511 කින් වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ජල ගබඩා හා විදුලි ගබඩා තොග මිලදී ගැනීම් රු. 3,603,870 ක් අදාල තොග ගිණුම හර කල යුතු වුවද, වර්ෂයේ වියදමක් ලෙස සැපයුම් හා උපකරණ ගිණුම යටතේ ගිණුම් ගත කර තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාල ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 48,077,000 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 39,699,004 ක් වූයෙන් වෙනස රු. 8,377,996 ක් විය.

1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 8,515,688 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,712,146 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,163,704 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 3,846 | 5,736 | 1,890 |
| (ii) බදු කුලී | 3,718 | 4,101 | 383 |
| (iii) බලපත්‍ර ගාස්තු | 552 | 662 | 110 |
| (iv) වෙනත් ආදායම් | 6,606 | 6,635 | 287 |

2.2.2 <u>වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

වාර්ෂිකව සමීක්ෂණ සිදු කර සහා බල ප්‍රදේශයේ පවතින සියළුම ව්‍යාපාර ආයතන වලින් වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

උසාවි දඩ හා මුද්දර ගාස්තු ලෙස පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,552,994 |
| (ii) | මුද්දර ගාස්තු | 2,000,000 |

2.2.4 ජල ගාස්තු

ජල පාරිභෝගිකයන් 13 දෙනෙකුගෙන් අය විය යුතු රු. 25,063 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

රු. 882,129 ක් වූ වත්කම් නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

2.4 මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා

2009 වර්ෂයේදී ජාතිය ගොඩනැගීමේ බදු වශයෙන් රැස් කළ රු. 11,205 ක මුදල දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.5 කොන්ත්‍රාත් පාලනය

කෝදුරුවත්තොට පාලම ඉදිකිරිම

රු. 2,500,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන මත කෝදුරුවත්තොට පාලම ඉදි කිරීමේ කර්මාන්තයේදී පැරණි පාලමෙන් ගලවා ඉවත් කරන ලද යකඩ ග්‍රේඩර් දෙකක් ආපසු සභාවට භාරදී නොතිබුණු අතර එය ලබා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

ඉහත පාලම සඳහා නිර්දේශිත අඩි 23 ක් දිග හා අඩි 02 ක් පළල කොන්ක්‍රීට් පැතලි බාල්ක 10 ක් සපයා සවිකල යුතුව තිබුණද, මාලිබොඩ මාර්ගයේ ආරම්භක ස්ථානයේ පැවති පාලමෙන් ගලවා ඉවත් කරන ලද කොන්ක්‍රීට් බාල්ක 05 ක් යොදා ගැනීමෙන් සහ ඒ සඳහා ගෙවීම් කිරීමෙන් රු. 421,550 ක් මූල්‍ය අක්‍රමිකතාවයක් සිදු කර ඇති බවට සභාවේ සභාපතිවරයා විසින් පාලම පරීක්ෂාවේදී ගනු ලැබූ ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටියක්ද, යොමු කරමින් පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කර තිබුණද, ඒ පිළිබඳව කිසිදු පරීක්ෂණයක් සිදු වී නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) තොග පාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය